# පිරිත් බලයෙන් කෙම් ක්‍රම (පැරණි පුස්කොළ පිටපතක් ඇසුරෙණි)

වයි. කේ. තිස්ස බණ්ඩාර[1]

## හැඳින්වීම

බෞද්ධ සමාජයේ විශේෂ අවස්ථාවල දී සජ්ඣායනා කරනු ලබන හා ශ්‍රවණය කරනු ලබන අගනා සූත්‍ර ධර්ම වෙසෙසක් වශයෙන් පිරිත් ධර්ම පිළිගැනුමට ලක්ව තිබේ. ථෙරවාදී බෞද්ධ රටවල පාලි භාෂා මාධ්‍යයෙන් සජ්ඣායනා කරනු ලබන පිරිත් දේශනා මාහැඟි ශාන්තිකර්ම සේ සැලකිය හැකි ය. ශාරීරික, මානසික රෝග හා බහුවිධ උපද්‍රවයන් දුරුකරනු වස් පිරිත් සූත්‍ර දේශනා කිරීම බුදුන්වහන්සේ ධරමාන සමයේ සිට ම පැවත එන්නේ ය. කෙම් ක්‍රම සඳහා පිරිත් භාවිතකර තිබේ. කෙම් යනු ක්ෂේමය, ආරක්ෂාව, රෝග නිවාරණාදිය සඳහා කරන ක්‍රියාවයි.

බුදුදහමට අයත් ගාථා තුළින් කෙම්ක්‍රම සිදුකිරීමට පෙළඹීම යන්ත්‍ර මන්ත්‍රවලින් ආරක්ෂාව පැතීම හා සමානවෙයි. සාමාන්‍යයෙන් පිරිත් දේශනා කිරීම වරු පිරිත, සර්ව රාත්‍රික, තුන්තිස්පැය, සති පිරිත ආදි වශයෙන් සිදුකරනු ලැබේ. ඒවාට අමතරව රහසිගතව පිරිත් කියා ආතුරයින් හෝ දේපළ ආරක්ෂා කළ ක්‍රමයක් අනාවරණය වෙයි. කට්ටඩිරාළ හෝ කපුමහතා මේ කාර්‍ය කරන්නට ඇත. කෙම් ක්‍රම සඳහා භාවිත කළ එබඳු පිටපතක එන තොරතුරු මෙයින් ප්‍රකාශ කෙරේ.

## ක්‍රමවේදය

අදාළ පුස්කොළ පිටපත මූලික මූලාශ්‍රය සේ භාවිත කරනු ලැබේ. තව ද මුද්‍රණයෙන් ප්‍රකාශනයට පත්ව ඇති ඒ හා සමාන හෝ ආසන්න සම්බන්ධයක් ඇති තොරතුරු මෙහි සන්දර්භය පෝෂණය කිරීම සඳහා පාදක කරගනු ලැබේ.

## අරමුණ

අභාවයට යමින් පවතින පුරාණ කෙම්ක්‍රම හා ආරක්ෂක විධික්‍රමවලට අයත් එක් කොටසක් මෙයින් එළි දැක්වීමත් බෞද්ධ ගාථා උපයෝගිකර ගනිමින් එබඳු සිරිත් නැවත ප්‍රචලිත කිරීමත් උදෙසා මෙය එළිදැක්වීම මෙහි මූලික අරමුණ වන්නේ ය.

[1] වැඩබලනපුස්තකාලයාධිකාරී,ශ්‍රීලංකාභික්ෂු විශ්වවිද්‍යාලය tis_bandara@yahoo.com

**සාරාංශය**

පිරිත් යන්නෙහි සිංහල අදහස ආරක්ෂාව අන්තරාය වළකනු රත්න සූත්‍රාදි ධර්මය වේ. බුදුන්වහන්සේ විසින් වදාළ ආරක්ෂක දේශනාව පිරිත් ධර්ම නම්. මෙයට " පරිත්ත" " පරිත්‍රාණ" පිරිත් යැයි කියනු ලැබේ. " *පරිත්තං තු පරිත්තාණෙ පරිත්තො තිසු අප්පකෙ*" යනු අභිධාන ශාස්ත්‍ර බැවින් පරිත්ත ශබ්දය පරිත්‍රාණාර්ථ අල්පාර්ථ දෙකෙහි වැටේ. මෙහි වනාහි පරිත්‍රාණාර්ථය වෙයි. මෙහි ලා පුරාතනයෝ " අන්තරයං පරිහරන්තං *තායතී ති පරිත්තං පරිතොවා*

*සම්බුපද්දවතො සත්තානං භයං උපද්දවං උපසග්ගං ච තායතී ති පරිත්තං*" ය 'යි නිර්වචන දැක්වූ ය.

පෙළෙහි සඳහන් නැති සූත්‍ර නිධාන කථා ආදිය අටුවාවෙයි සඳහන් වෙයි. ආනන්ද වනරතන හිමියන්ගේ ශිෂ්‍ය හිමිනමක් විසින් සංග්‍රහ කරනු ලැබ ඇති අටුවාව මේ අතරින් සුවිශේෂ වන්නේ ය. එය සාරත්ථසමුච්චය නම් වෙයි.[3] වැලිවිට සරණංකර සංඝරාජයන් වහන්සේගේ කෘතියක් වන ''සාරාර්ථ දීපනි'' හෙවත් සතර බණවර සන්නය පිරිත් සම්බන්ධයෙන් වැදගත් සන්න පොතක් වන්නේය.[4] බුද්ධඝෝෂ හිමියන්ගේ කෘතියක් වූ පරමත්ථජෝතිකාවෙහි මංගල, රතන, මෙත්ත සූත්‍රවල වර්ණනාව අන්තර්ගත වෙයි.[5]

පිරිත් සම්බන්ධයෙන් 'රිස් ඩේවිස්' මැතිණිය මෙසේ සඳහන් කර තිබේ.

" පිරිත් සජ්ඣායනයෙන් නැගෙන නාදය විනිවිද යන ක්‍රියාකාරී බලවේගයන්සේ සැලකේ. යහපත් අදහස්වල ශක්තිය ශබ්ද තරංග සමග මුසුවී බොහෝ ඈත සිටින සත්ත්වයන් වෙත ද විකාශනය වෙයි. පිරිතෙහි ළයාන්විත නාදය ස්නායු පද්ධතිය පිනවීමට ද රුධිරයේ පවිත්‍රත්වයට ද මානසික සංහිඳියාව ඇතිවීමට ද හේතුවන බැවින් මානසික මෙන්ම ශාරීරික සුවය ද දනවති' යි සැලකිය හැකිය''[6] යනුයි.

අප සතුව පවතින එක්තරා පුස්කොළ පිටපතක් ඇසුරෙන් පිරිත් බලයෙන් විවිධ කෙම් ක්‍රම හා අභිචාර විධි පැවැත්වූ බවක් පෙන්නුම් කරයි. ''පිරිත් සන්නය'' නම් එකී පුස්කොළ පිටපත පාරම්පරිකව පැවත ආ පැරණි පිටපතකි. එහි අන්තර්ගත කරුණු විවිධ කෙම් ක්‍රම සඳහා පුරාතනයේ දි භාවිතව පැවති බව පැහැදිලි ය. එකී පිටපතේ රතන සූත්‍රය,[7] මෙත්ත සූත්‍රය,[8] ධජග්ග සූත්‍රය[9] යන සූත්‍ර අනුසාරයෙන් කෙම් ක්‍රම පෙන්නුම් කරනු ලබයි. ඒවාගේ උපයෝගිතා මෙසේ ය.

**සියලු කාරියට**

*''යානිධ භූතානි සමාගතානි ........*

*තස්මාහි භූතානි නිසාමේථ සබ්බේ''*

යන ගාථා දෙක ජප කරන කල පිරිසිදු වස්ත්‍රයක් ඇඳ සඟනට කිරිබත් පුදා ගිතෙල් පහන් පුදා මා සිතුවායි සිද්ද වේවායි කියා බුදුන්ට ආරාධනා කොට ලකවැලක් ගෙන අටතුරාසියක් පුරවනු. සියලු කාරියට යහපති. (මෙහි ලකවැල යනු නවගුණ වැලයි. වරහන මවිසිනි).

**භය දුරුවීමට, ගැබ් පිහිටීමට**

*" යං කිඤ්චි චිත්තං ඉධ වා හුරං වා...."*

යන ගාථාව යක්ෂයින්ට තෙල් නූල් මතුරණු යක්ෂ මූර්ච්ඡාවට යක්ෂ උපද්‍රවයට යහපති. බාලයින්ට මතුරණු කොළ මැඩවීමට ගල් හතරක් මතුරා ගාථාව ලියා වාරිය කන්දේ හතර කොන වළලනු අරක්ගලට දපා එසේම කරනු කොලපල්ල නුගුලුවා මඩවනු යක්කු වී නොගනිත්. මෙම ගය ඔපස් (ඔසප්. වරහන මවිසිනි) ගන්නා දා මතුරා පොවනු දරුවෝ සිටිත්.

**ශ්‍රියාව ඇතිවීමට, සර්පභයට, භෝග ආරක්ෂාවට -**

*" යේ පුග්ගලා අට්ඨ සතං පසත්ථා..."*

යන ගාථාව අතට මතුරා ඇඟ අතගානු ශ්‍රියා ඇති වෙයි සියලු භය දුරුවෙයි. සිහි කරනු සතුරෝ මිතුරෝ වෙත් සටනට යනු දිනත් සිහිකරනු සර්ප උපද්‍රව නොවෙයි. බෝගවලට පනු උපද්‍ර නැතිවෙයි.

**හී නොවැදීමට, ආරක්ෂාවට, වාදයෙන් දිනීමට -**

*" යේ සුප්පයුත්තා මනසා දළ්හේන..."*

අතුන් හා යුක්ති බනනක කල කාඩි ශැලිය තිබූ තැනින් අකුරක් ගෙන සුවඳ පැනින් නාවා මතුර දුමෙහි තබනු දකුණු පය පෙරට තබා යනු දිනත්, කුරුම්ණියන් කෑ පතක් කළුවර දා පේ කොට තමා ආයුධ ගන්නා කල ඉන් එක පතක් ඉන තබා අනෙක පෙකනියේ තබා සටනට යනු.

**සතුරෝ ඇති නොවීමට**

*"යථින්ද ඛීලෝ පඨවිංසිතෝ සියා..."*

මෙම ගය සමන් මලට අටතුරාසියක් මතුරා මහ සෑයක හෝ මහ බෝධියක හෝ පිදුව දෙවියෝ අරගිනිති. සර්ප බව නොවෙයි.

**රජුන් මහතුන් දැකීමට**

*"කරණීය මත්ථ කුසලේන"*

යන ගාථාවෙන් තෙලට අට වරක් මතුරා තිලක ලා යනු රජුං මහතුං දැකීමට යහපති.



BHIKSHU UNIVERSITY OF SRI LANKA
07 APR 2015

**නුවන වැඩිවීමට, ආයුෂ වැඩිවීමට -**

*"සන්තුස්සකෝ ච සුභරෝච"*

යන ගාථාව අවුරු කෝනය දා සමන්මල් තුන් සීයක් ගෙන අට වරක් මතුරා වළඳනු, ආයුෂ නුවන වැඩීමට යහපති.

**කිඹුලන්ට -** *"නච කුද්දං සමාචරේ කිඤ්චි"*

යන ගාථාව කිඹුලාට මතුරනු යහපති.

**අලියට, වලහට -** *'දිට්ඨා වා යේව අද්දිට්ඨා"*

යන ගාථාව අටතුරාසියක් දපා කොළ මිරිකනු. අටුවට වී දමනු අලුත් ගෙවල් වලට ගෙවදිනු.

**අංගම් හූනියන් නොවැදීමට -** *" න පරෝ පරං නිකුබ්බේථ"*

යන ගාථාව නෙරළු තෙලට දපා ගසනු අංගමෙන් මලෝ උපදින්, අංගං, සූනියං නො වදි.

**අනවින හූනියන් නොවැදීමට -** *" සචේමාරිසා දේවනං සංගාම ගතානං උප්පජෙය්‍ය භයං වා"*

යන ගාථාව අනවින හදි හූනියන් නො වදී.

**ඇස්වහ කටවහට, යක්ෂ භයට -** *"නො චේ මේ ධජග්ගං උල්ලෝකෙය්‍යාථ, අථ පජාපතිස්ස"*

යන ගාථාව අනවින හදි හූනියන් නොවදී. යක්ෂ භය පහවේ

ඉහත සඳහන් කරනු ලැබ ඇත්තේ නිදර්ශන කීපයක් පමණි. අදාළ පිටපතේ තව ද බොහෝ කරුණු අන්තර්ගත වෙයි. වසර කීපයකට වඩා පැරණි පුස්කොළ පිටපතකි.

**නිගමනය**

බෞද්ධයෝ ආරක්ෂාව සඳහා සහ සෙත් ශාන්තිය මෙන් ම සමාජය සුඛිත මුදිත කරගැනීම සඳහා පිරිත් ආශ්‍රය කරගන්නා බව ප්‍රකට ය. පිරිත් බලයෙන් කෙම් ක්‍රම හෝ අභිචාරවිධි පවත්වනු ලැබ ඇත්තේ ද සුවිශේෂී බලාපොරොත්තු උදෙසා ය. රසායනික ඖෂධ මගින් අද පිරිමසා ගැනීමට උත්සහා කරනු ලබන ඇතැම් උපයෝගිතාවන් පිරිත් බලයෙන් සපුරාගත හැකි බව අපේක්ෂා කළ හැකි ය. මේවා ශාරිරික හා මානසික පීඩා මෙන්ම කෘෂිකාර්මික සමාජ අවශ්‍යතා සඳහා ද යෝග්‍යවනු නො අනුමාන ය. වර්තමානයේ වුව ද මෙකී කෙම් ක්‍රම භාවිතයෙන් සමාජීය අවැසියාවන් සපුරාගැනීමට හැකි බව නිගමනය කරමු.

**ප්‍රමුඛ පද: අප්‍රකට පුස්කොළ පොත්, පිරිත් , කෙම් ක්‍රම, අභිචාරවිධි**

**ආශ්‍රිත ග්‍රන්ථ**

පාළි - සිංහල පිරිත් පොත, සම්පාදක කිරිවත්තුඩුවේ ධර්මකීර්ති ශ්‍රී ප්‍රඥාසාර හිමි. (2002). කොළඹ: එස්. ගොඩගේ. පිට. 31.

*සාරත්ථසමුච්චය නාමා චතුභාණවාරට්ඨකථා*, සම්පාදක දොරණාගොඩ ඤාණසේන හිමි, (1929). කොළඹ: හේවාවිතාරණ මුද්‍රණය.

*සාරාර්ථ දීපනි සතර බණවර සන්නය.* සංස්කරණය අත්තුඩාවේ සිරි රාහුල හිමි, (2000). මරදාන: සමයවර්ධන සමාගම.

*පරමත්ථජෝතිකා නම් වූ ඛුද්දකපාඨට්ඨකථා.* සිංහල පරිවර්ථනය මැදඋයන්ගොඩ විජයකිත්ති හිමි (2009). නැදිමාල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*පිරුවානා පොත්වහන්සේ*, සම්පාදක, අත්තුඩාවේ රාහුල හිමි. (1994) මරදාන: සමයවර්ධන සමාගම, පෙරවදන xviii

*ශ්‍රී සුමංගල ශබ්දකෝෂය.* සම්පාදක වැලිවිටියේ සෝරත හිමි. (1999) කොළඹ: එස්. ගොඩගේ. පිට. 610.